# Abstract No 47
# වජ්‍රයානිකයන්ගේ ශූන්‍යතා විග්‍රහය පිළිබඳ හැඳින්වීමක්

මහාචාර්ය කහපොල සුගතරතන හිමි

සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

තන්ත්‍රයානය යන පොදු නමකින් හැඳින්වුවත් එය විවිධ ශාඛාවන්ගෙන් සමුපේත වූවකි. වජ්‍රයාන, සහජයාන, කාලචක්‍රයාන යැයි එහි ප්‍රධාන ශාඛා තුනකි. මේවායෙහි මූලික ඉගැන්වීම්හි සමානතා දක්නට ඇතත් අසමානතා ද දිස්වේ. උදාහරණයක් ලෙස වජ්‍රයානයෙහි බුද්ධත්තවය හඳුන්වන්නේ වජ්‍රසත්ව යනුවෙනි. විශේෂයෙන් ශූන්‍යතාව අලුතෙන් අර්ථකථනය කරනු දක්නට ලැබේ. දාර්ශනික වශයෙන් වජ්‍රයානය ශූන්‍යතා දර්ශනය හා සම්බන්ධ වේ. දැඩි වූ හරවත් වූ ඝනවූ කැඩිය නොහැකි සිඳිය නොහැකි දැවිය නොහැකි විනාශ කළ නොහැකි ශූන්‍යතාව වජ්‍රයාන යැයි කියනු ලැබේ.) මහායානය මෙන්ම වජ්‍රයානය ද විශ්ව විමුක්තියක් (universial salvation) පිළිබඳව උගන්වයි. වජ්‍රයානිකයෝ වජ්‍රසත්ව උත්තරීතර දෙවිකෙනෙකු මෙන් සලකති. උතුම් යෝග තන්ත්‍රයක් යයි කියන ලද ශ්‍රේෂ්ඨ වජ්‍රයානය යමෙක් නොදනී ද ඒ මෝඩයෝ බවසයුරෙහි සැරිසරත්. සියලු සත්වයන් වජ්‍රසත්ව තත්වයට පැමිණෙන තුරු සිය විමුක්තිය කල් දමන්න යයි ඉන්ද්‍රභූති රජ සියලු බුදුවරුන්ගෙන් ඉල්ලා සිටි බව ඥාන සිද්ධියෙහි සඳහන් වේ. වජ්‍රයානයට අනුව අති උතුම් බුදුන් ලෙස සලකනුයේ වජ්‍රසත්වය. ඔහු තුල කරුණාව හෙවත් උපායයත් ශූන්‍යතා හෙවත් ප්‍රඥාවත් පවතී. දාස්ගුප්ත වජ්‍රසත්ව අදහස විඥානවාදීන්ගේ අභූත පරිකල්පය සමග සසදා දක්වයි. සෑම සත්වයෙක් තුළම වජ්‍රසත්ව බව පවතී. ප්‍රඥොපාය විනිශ්චය සිද්ධියෙහි ශූන්‍යතා ගර්භ නමින් වජ්‍රසත්ව හැඳින්වේ. ශූන්‍යතාවෙහි සහ කරුණාවෙහි වෙනස පහනෙහි සහ ආලෝකයෙහි වෙනස මෙනි. ශූන්‍යතාවෙහි සහ කරුණාවෙහි සමානතාව පහනෙහි සහ ආලෝකයෙහි සමානතාවය මෙනි) පහනේ වැටිය ඉවත් කළවිට අන්ධකාරය පැතිරෙයි. එමෙන්ම කරුණාවෙන් ප්‍රඥාව ඉවත් කළ විට අවිද්‍යාව රජයයි. ප්‍රඥාව ඍණාත්මක (negative) තත්වයයි. උපාය හෙවත් කරුණාව ක්‍රියාකාරී ධනාත්මක (positive) තත්තවයයි. ශූන්‍යතාව උපායෙන් වෙන් වූ විට උපාය අනන්ත බන්ධනයකට අසුවෙයි. ගුහ්‍ය සමාජ තන්ත්‍රයෙහි ම සඳහන් පරිදි දහසය හැවිරිදි ළදක් ප්‍රඥා නමින් අභිෂේක කල යුතුය. එය මහා මුද්‍රා නමින් ද හැඳින්වේ.  විශ්වයේ ආරම්භය පැවැත්ම සහ විනාශය සිදුවනුයේ  ප්‍රඥා උපාය මගිනි. සසරින් මිදීම ද ප්‍රඥා උපාය දෙකෙහි සමාන පැවැත්මෙන් සිදු වේ. ප්‍රඥා උපාය විශ්වය තුළ කුඩා විශ්වයකි. (miniature universe) වජ්‍රයානය බාහිරව බලන විට රහස් ධර්ම, ශෘංගාර, අභිනය, මන්ත්‍ර, මුද්‍ර, මණ්ඩල, යොගවිධි ආදියෙන් සැදුම්ලත් ආගමික ක්‍රමයකි. අභ්‍යන්තර ස්වාභාව විමසීමේදී උත්කෘෂ්ට භාවනා ක්‍රමයක් ලෙස අනාවරණය වේ. යාථා පරිදි භාවනා සහ යෝගක්‍රම ප්‍රගුණ කිරීමෙන් විශ්ව ස්වභාව වන ශූන්‍යතාව අවබෝධ කෙරේ. යථාභූත ඥානදර්ශනය ඉතා සියුම් බැවින් එම ඥානමාර්ගයට පිවිසීමේ ප්‍රාථමික පියවරක් ලෙස වන්දනා, පූජා, මන්ත්‍ර, මුද්‍රා ආදිය භාවිත කළ යුතුය. කෙසේ වෙතත්  ගම්භීර ශූන්‍යතා දර්ශනය වෙනුවට සාමාන්‍ය අනුගාමිකයන් අතර බාහිර අභිචාර විධි වඩා ජනප්‍රිය වී ඇති බව සත්‍යකි. කිසියම් ලෞකික සහනයක්  එම ක්‍රම මගින් බැතිමතුන් අත්දකිනවා විය හැකිය. වජ්‍රයානයෙහි අභිචාර ක්‍රම 6ක් ඉගැන්වේ. තන්ත්‍රයානයම වජ්‍රයානය යන නමින් හැඳින්වෙන්නට විය. සත්‍ය ලෙසම පැරණි නාමය මන්ත්‍රයාන යන්නයි. සේකොද්වේශ ටීකාවෙහි ශූන්‍යතා සහ කරුණා ස්ථාවර සංයෝගයක් ලෙස ඉගැන්වේ.

ප්‍රමුඛපද: වජ්‍රයානික, ශූන්‍යතා, ප්‍රඥා උපාය, යථාභූත ඥානය